# රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය

# ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

# මිල ගණන් කැඳවීමයි

ප්‍රසම්පාදන අංකය - DMC/FIN/2021 (PROCU: 03) - II

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ සිද්ධි විධාන ලොරි රථය හා ජංගම ප්‍රදර්ශන ලොරි රථය ගාල් කිරීමට ආවරණයක් ඉදිකිරීම සඳහා වන ප්‍රසම්පාදනය සඳහා උනන්දුවක් දක්වන පාර්ශවයන් වෙතින් මිල ගණන් කැඳවීමට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කර තිබේ.

ඒ අනුව, උක්ත කරුණ සම්බන්ධව ඔබ ආයතනය උනන්දුවක් දක්වන්නේ නම්, මේ සමඟ පහතින් දක්වා ඇති දළ සැලැස්ම හා පිරිවිතරයන්ට අනුව වන ඔබ ආයතනයේ මුද්‍රා තැබූ මිල ගණන් 2021.05.12 දින පෙ.ව.10.30 හෝ ඊට පෙර "ලොරි රථය ගාල්කර තැබීම සඳහා ආවරණයක් ඉදිකිරීම - DMC" යනුවෙන් ලිපි කවරයේ වම් පස ඉහළ කෙළවරේ සඳහන් කර අධ්‍යක්ෂ ජනරාල්, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, ප්‍රසම්පාදන ඒකකය, මුදල් අංශය, 3 වන මහළ, විද්‍යා මාවත, කොළඹ 07 යන ලිපිනයට ලියාපදිංචි තැපැල මගින් හෝ 3 වන මහලේ, මුදල් අංශයේ ඇති ටෙන්ඩර් පෙට්ටිය වෙත ගෙනැවිත් බහාලන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

මිල ගණන් ඉදිරිපත් කිරීමට පෙර අදාළ පරිශ්‍රය නිරීක්ෂණය කිරීමට අවශ්‍ය නම් පමණක් ඒ සඳහා සතියේ දින වල එනම්, සඳුදා සිට සිකුරාදා දක්වා පෙ.ව. 9.00 සිට ප.ව.3.00 දක්වා කාලය තුල සිදුකළ හැක.

තවද, මිල ගණන් ඉදිරිපත් කිරීමේදී, ඔබ ආයතනයේ බලයලත් නිලධාරියෙකු විසින් අත්සන් කර හා ආයතනයේ නිල මුද්‍රාව තබා මිල ගණන් ඉදිරිපත් කිරීම අනිවාර්යය වේ.

අධ්‍යක්ෂ ජනරාල්
ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය
විද්‍යා මාවත
කොළඹ 07.
දු.අ. 0112-136270 / 011-3668096